රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **Combined Services Division**
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | *Independence Square, Colombo 07, Sri Lanka*

දුරකතනය / தொலைபேசி / Telephone: 011- 2694560
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2692254
ඊ- මේල් / மின்னஞ்சல் / E-mail: dgcs@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No: CS/OES/රා.ප.චක්‍ර/11/2026
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2026.05.19

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>2026 අයවැය අනුව, රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන සිටි සේවකයන්ට ස්ථිර පත්වීම් ලබාදීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2026.04.30 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/2026 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ **ඒකාබද්ධ සේවාවට අයත් රියදුරු හා කාර්යාල සේවක සේවයේ** පුරප්පාඩු සඳහා බඳවා ගන්නා ලද උක්ත සඳහන් සේවක කාණ්ඩයන් සඳහා ස්ථිර පත්වීම් ලබා දීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි වැඩිදුරටත් අවධානය යොමුකර විධිමත් පත්වීම් ලබාදීම සඳහා කඩිනමින් මා වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. ඒකාබද්ධ සේවයට අයත් රියදුරු හා කාර්යාල සේවක සේවයේ තනතුරු සඳහා බඳවාගෙන එම තනතුරුවල මේවන තෙක් සේවය කළ යුතුය.

II. රා.පරි.ච. 25/2014 හි හා රා.පරි.ච. 25/2014(I) හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

III. 2019.09.01 දිනට වැඩකරන දින 180ක සතුටුදායක සහ අඛණ්ඩ සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

IV. රියදුරු තනතුර සඳහා තාවකාලික / අනියම් (දෛනික) / ආදේශක / කොන්ත්‍රාත් හෝ සහන පදනමට පත්වූ දිනට, පෞද්ගලික/ කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. ( අවම වශයෙන් සී සහ සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.)

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2026 මඟින් දක්වා ඇති සුදුසුකම් හා ඉහත සඳහන් අවශ්‍යතා සෑම ආකාරයෙන්ම සපුරන ලද සේවකයන් සඳහා පමණක් තාවකාලිකව පත්වීම් ලිපි ආයතන ප්‍රධානියා විසින් නිකුත් කළ යුතුය.

කා.සේ.සේ. තාවකාලික පත්වීම් ලිපිය ආකෘතිය - ඇමුණුම 01

රියදුරු තාවකාලික පත්වීම් ලිපිය ආකෘතිය - ඇමුණුම 02

03. එක් එක් නිලධාරියා වෙනුවෙන් වෙන වෙනම ගොනු සකස් කර විධිමත් පත්වීම් නිකුත් කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය **(කා.සේ.සේ. ඇමුණුම 03, රියදුරු ඇමුණුම 04)** සම්පූර්ණකර එම පිළිවෙලින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය.

04. තවද, ගොනු සැකසීමේදී **කා.සේ.සේ. ඇමුණුම 05, රියදුරු ඇමුණුම 06 හි** සඳහන් උපදෙස් තරයේ අනුගමනය කරමින් ලිපි ලේඛන වල සහතික පිටපත් එම පිළිවෙලින් (අංක 01 ගොනුවේ යටට එන ලෙස) අමුණා එවිය යුතුය. අඩුපාඩු සහිතව ලේඛන එවීමේදී විධිමත් පත්වීම් ලබාදීමට ප්‍රමාදවන බැවින් ලබා දී ඇති උපදෙස් නිසි පරිදි අනුගමන කිරීමට වගබලා ගත යුතුය. මේ සම්බන්ධව වැඩිදුර විමසීම සඳහා 0112696211 (කා.සේ.සේ.-දිගුව 607/608 හෝ රියදුරු සේවය-දිගුව 609/610) අමතා ලබාගත හැකිය.

05. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2026 සහ ඉහත සඳහන් සුදුසුකම් සපුරා නොමැති සේවකයන් වෙත විධිමත් පත්වීම් ලබාදීමට හැකියාවක් නොමැති බැවින්, තාවකාලික පත්වීම් ලබා දීමේදී අදාළ සුදුසුකම් සපුරා ඇති බවට ඔබ පෞද්ගලිකවම සෑහීමකට පත් විය යුතුවේ.

06. තාවකාලික පත්වීම් ලිපි නිකුත් කර මාස 03ක් ඉක්ම යාමට පෙර විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා, එම ගොනු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

එන්. යූ. නිශාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

දුරකථන : 0112694560 - est 500

ෆැක්ස් : 0112692254

විද්‍යුත් ලිපිනය : dgcs.pubad@gmail.com

**තාවකාලික පත්වීම් ලිපිය** ඇමුණුම 01

මගේ අංකය:-
............................. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව
කොළඹ
2026. දින.

.... (උප්පැන්න සහතිකය හා ජා.හැ.ප. අනුව මුලකුරු සමග නම).. මහතා/මහත්මිය/මෙනවිය
ජා.හැ.අංකය :- ..........................................................................................

**<u>කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම</u>**

රා.පරි.චක්‍රලේඛ 29/2019 ප්‍රකාරව **2019.09.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ ................................ තනතුරකට පත් කරමි.

02. මෙය තාවකාලික පත්වීම් ලිපියක් වන අතර, නියමිත සුදුසුකම් සපුරා තිබේ නම් විධිමත් පත්වීම් ලිපියක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් යථා කාලයේදී නිකුත් කරනු ඇත. එසේ නොවන්නේ නම් මෙම පත්වීම අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

03. ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝග වලට හා කලින් කල ආණ්ඩුව විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි සහ නියෝග වලටද, ඔබ යටතේ විය යුතුය.

04. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 24,250 - 10 X 250 - 10 X270 - 10 X 300 - 12 X 330 – 36,410/= කි. 2016.02.25 දිනැති අංක 03/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් විධි විධාන අනුව ගෙවීම් සිදු කරනු ලැබේ. පත්වීමේ දින සිට වසර තුනක් ඇතුලදී කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ඔබ සමත් විය යුතුය.

05. **පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යෙන්ම සේවය කළ යුතු ය.** කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂි හේතුන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

06. මෙම ලිපිය ලැබුණු බවත්, මෙහි දැක්වෙන කොන්දේසි යටතේ ඔබ මෙම තනතුර භාර ගන්නේද යන්න දෙසතියක් තුළ දී මා වෙත දන්වන්න. සාධාරණ හේතුවක් නොමැතිව ඉහත සඳහන් පරිදි රාජකාරියට වාර්තා කිරීමට ඔබ අපොහොසත් වුවහොත් මෙම පත්වීම අවලංගු වනු ඇත.

.........................................................
අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන
මුද්‍රාව :-

පිටපත :- ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**තාවකාලික පත්වීම් ලිපිය** ඇමුණුම 02

මගේ අංකය:-
............................ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව
කොළඹ.
2020. දින.

.............................................................. මගින්,
.............................................................. මහතා/මහත්මිය/මෙනවිය වෙත.
ජා.හැ.අංකය :- ..........................................................................

## <u>රියැදුරු III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම</u>

රා.පරි.චක්‍රලේඛ 29/2019 ප්‍රකාරව **2019.09.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ රියදුරු III ශ්‍රේණියේ තනතුරකට පත් කරමි.

02. මෙය තාවකාලික පත්වීම් ලිපියක් වන අතර, නියමිත සුදුසුකම් සපුරා තිබේ නම් විධිමත් පත්වීම් ලිපියක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් යථා කාලයේදී නිකුත් කරනු ඇත. එසේ නොවන්නේ නම් මෙම පත්වීම අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

03. ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝග වලට හා කලින් කල ආණ්ඩුව විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි සහ නියෝග වලටද, ඔබ යටතේ විය යුතුය.

04. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,790 - 10 X 270 - 10 X300 - 10 X 330 - 12 X 350 – 38,990/= වේ. රු. 26,600 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමකි. ( 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව )

05. **පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය.** කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

06. මෙම ලිපිය ලැබුණු බවත්, මෙහි දැක්වෙන කොන්දේසි යටතේ ඔබ මෙම තනතුර භාර ගන්නේද යන්න දෙසතියක් තුළ දී මා වෙත දන්වන්න. සාධාරණ හේතුවක් නොමැතිව ඉහත සඳහන් පරිදි රාජකාරියට වාර්තා කිරීමට ඔබ අපොහොසත් වුවහොත් මෙම පත්වීම අවලංගු වනු ඇත.

.........................................................
අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන
මුද්‍රාව :-

පිටපත :- ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**2026 අයවැය අනුව, රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන සිටි සේවකයන්ට ස්ථිර පත්වීම් ලබාදීම.**

**නිලධාරියාගේ මුලකුරු සමඟ නම :- ........................................................................**

**ජාතික හැඳුනුම්පත් අංකය :- ........................................................................**

**පත්වීම ලද ආයතනයේ නම:- ........................................................................**

| | | පිටු අංකය |
|---|---|---|
| 01. | රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද උප්පැන්න සහතිකයේ සහතිකකළ පිටපත | |
| 1.1 | උපන් දිනය : ............ 2019.09.01 දිනට වයස — අවු. ...... මාස. ...... දින. ...... | |
| 1.3 | අවු. 45 ට වැඩිනම් රා.ප.ව. 11/2026 හි 8.ii අනුව පත්වීමක් ලබා දී ඇත: ☐ නැත : ☐ | |
| 02. | ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත | |
| 03. | ඉදිරිපත් කරනු ලබන සහතිකවල නමෙහි වෙනසක් ඇත්නම් දිවුරුම් ප්‍රකාශය | |
| 04. | ශිෂ්‍ය කාර්ය දර්ශනයෙහි සහතික කල පිටපත<br>8 ශ්‍රේණිය/9 වසර සමත් ☐ අසමත් ☐ | |
| 4.1. | 8 ශ්‍රේණිය / 9 වසර අසමත් නම් රා.පරි.ව. 25/2014(1) අනුව පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර ඇති බවට සහතිකයේ සහතිකකළ පිටපත | |
| 4.2 | අ.පො.ස (සා.පෙළ) පෙනී සිට ඇත්නම් ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපත — විශිෂ්ය ...... අධි සම්මාන ...... සම්මාන ...... සාමාන්‍ය ...... | |
| 05. | 2019.09.01 දිනට පෙර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත ලිපියේ සහතික කරන ලද පිටපත | |
| 06. | තාවකාලික/අනියම් (දෛනික)/ ආදේශක/ කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගත් ලිපියේ සහතික කරන ලද පිටපතක්<br>බඳවාගත් තනතුර : ☐ පත්වීම් දිනය : ☐ | |
| 07. | චර්යා සටහනෙහි (පොදු 226 අ) සහතික කරන ලද පිටපත (2019.09.01 දිනට වැඩ කරන දින 180 සම්පූර්ණ විය යුතුය.) | |
| 08. | රා.ප.ව. 29/2019 හෝ 11/2026 අනුව නිකුත් කරන ලද තාවකාලික පත්වීම් ලිපිය<br>පත්කළ තනතුර : ☐ පත්වීම් දිනය : ☐ | |
| 09. | සම්පූර්ණ කරන ලද ඉ - මානව සම්පත් දත්ත වාර්තාව | |

ගොනුවේ අනුපිළිවෙලින් ඇති ඉහත සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි අතර, රා.ප.ව. 11/2026 අනුව අදාළ සියලු සුදුසුකම් සපුරා ඇත. එබැවින් උක්ත නම් සඳහන් අය .................................... දිනට ඒකාබද්ධ කාර්යාල සේවක සේවයේ ............................................ තනතුරට පත්කිරීම නිර්දේශ කරමි.

..........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානී / බලය පවරනලද නිලධාරී
අත්සන හා දිනය (නිල මුද්‍රාව සහිතව)

..........................................................

අමාත්‍යාංශ ලේකම් / බලය පවරනලද නිලධාරී
අත්සන හා දිනය (නිල මුද්‍රාව සහිතව)

**2026 අයවැය අනුව, රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන සිටි සේවකයන්ට ස්ථිර පත්වීම් ලබාදීම.**

**නිලධාරියාගේ මුලකුරු සමඟ නම** :- .....................................................................................

**සේවා ස්ථානය** :- .....................................................................................

| | | |
|---|---|---|
| 01. | තාවකාලික/අනියම් (දෛනික)/ ආදේශක/ කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගත් ලිපියේ සහතික කරන ලද පිටපතක් පත්වීම් දිනය : ..YYYY / MM / DD.. | |
| 02. | චර්යා සටහනෙහි (පොදු 226 අ) සහතික කරන ලද පිටපත (2019.09.01 දිනට වැඩ කරන දින 180 සම්පූර්ණ විය යුතුය). | |
| 03. | රා.ප.ච. 29/2019 අනුව නිකුත් කරන ලද තාවකාලික පත්වීම් ලිපිය | |
| 04. | රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද උප්පැන්න සහතිකය | |
| 05. | උපන් දිනය : ..YYYY / MM / DD.. | |
| 05.1 | 2019.09.01 දිනට වයස අවු: ☐ මාස: ☐ දින: ☐ | |
| 05.2 | අවු. 45 ට වැඩිනම් රා.ප.ච. 11/2026 හි 8.ii අනුව පත්වීමක් ලබා දී ඇත: ☐ නැත : ☐ | |
| 06. | ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත ජා.හැ.අංකය : .................................... | |
| 07. | ශිෂ්‍ය කාර්ය දර්ශනයෙහි සහතික කළ පිටපත | |
| 07.1 | 8 ශ්‍රේණිය/9 වසර සමත් ☐ අසමත් ☐ | |
| 08. | අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල ලේඛනය<br>විශිෂ්ඨ : ……… අධි සම්මාන : ……… සම්මාන : ……….. සාමාන්‍ය: ……….. | |
| 09. | 8 ශ්‍රේණිය / 9 වසර අසමත් නම් රා.පරි.ච. 25/2014(1) අනුව පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර ඇති බවට සහතිකය | |
| 10. | කල් ඉකුත් නොවූ වලංගු රියදුරු බලපත්‍රයේ සහතික පිටපත (ඉලෙක්ට්‍රොනික් රියදුරු බලපත්‍රය නොමැතිනම් ඒ වෙනුවට නිකුත් කරනු ලබන එක් එක් කාණ්ඩ කල් ඉකුත් වන දිනයන් පිළිබඳ විස්තර සහිත සහතිකය) | |
| 11. | සාමාන්‍ය පෙනීම, රාත්‍රී ඇස් පෙනීම සහ වර්ණ දෘෂ්ටිය පිළිබඳ රජයේ වෛද්‍ය නිලධාරියෙකුගේ නිර්දේශය (සෞඛ්‍ය 169/ සෞඛ්‍ය 307) | |
| 12. | 2019.09.01 දිනට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත ලිපියේ සහතික කරන ලද පිටපතක් | |
| 13. | ඉදිරිපත් කරනු ලබන සහතිකවල නමෙහි වෙනසක් ඇත්නම් දිවුරුම් ප්‍රකාශය | |
| 14. | ඉ-දත්ත පත්‍රිකාව | |

ගොනුවේ අනුපිළිවෙලින් ඇති ඉහත සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි අතර රා.ප.ච. 11/2026 අනුව අදාළ සියලු සුදුසුකම් සපුරා ඇති බැවින් උක්ත නම් සඳහන් නිලධරයා .................................... දිනට ඒකාබද්ධ රියදුරු සේවයට පත් කිරීම නිර්දේශ කරමි/ නොකරමි.

...............................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා දිනය
(නිල මුද්‍රාව සහිතව)

...............................................................
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන හා දිනය
(නිල මුද්‍රාව සහිතව)

ඇමුණුම 05

**2026 අයවැය අනුව, රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන සිටි සේවකයන්ට ස්ථිර පත්වීම් ලබාදීම.**

2026.04.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2026 අනුව ඒකාබද්ධ කාර්යාල සේවක සේවයේ විධිමත් පත්වීමක් ලබාදීම සඳහා අවශ්‍ය ලේඛන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීමේදී පහත සඳහන් ලේඛන අනුපිළිවෙලින් (අංක 01 ලේඛනය ගොනුවේ යටටම සිටින පරිදි) එවීම කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. ඡායා පිටපත් ඉදිරිපත් කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ විධිමත් බලය පැවරූ නිලධාරියකු විසින්ම සත්‍ය හා නිවරදි බවට සහතික කළ තිබිය යුතුය.

1. රෙජිස්ට්‍රාර් ජනරාල් / අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද උප්පැන්න සහතිකයේ දෙපසම සහතික කරන ලද පිටපත.
2. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත.
3. ඉදිරිපත් කරන සහතික වල නමෙහි වෙනසක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්. (දිවුරුම් ප්‍රකාශයේ ආකෘතිය ඇමුණුම 07)
4. ශිෂ්‍ය කාර්ය දර්ශනයේ සහතික කරන ලද පිටපත.
5. රා.පරි.ච. 25/2014(I) අනුව අදාළ පුහුණු පාඨමාලාව සම්පූර්ණකළ බවට නිකුත් කරනු ලබන සහතිකයේ සහතික කරන ලද පිටපත. (අදාළනම් පමණක්)
6. විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද අ.පො.ස. සා/පෙළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කරන ලද පිටපත (පෙනීසිට ඇත්නම් පමණක්).
7. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් (2019.09.01 දිනට පෙර) කා.සේ.සේ. තනතුර අනුමත කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපත.
8. තාවකාලික/අනියම්(දෛනික)/ආදේශක/කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගත් ලිපියේ සහතික කරන ලද පිටපත.
9. චර්යා සටහනේ (පොදු 226 'අ') සහතික කරන ලද පිටපත ( 2019.09.01 දිනට වැඩ කරන දින 180 සම්පූර්ණ කර තිබිය යුතුය)
10. තාවකාලික පත්වීම් ලිපියේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පිටපත. (ඇමුණුම 01 පරිදි)
11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය. (ඇමුණුම 03 ආකෘතිය)
12. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඒකාබද්ධ සේවා අංශයෙහි ඉ - මානව සම්පත් ව්‍යාපෘතිය යටතේ දක්වා ඇති දත්ත පත්‍රිකාව බාගත කර සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

**<u>2026 අයවැය අනුව, රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන සිටි සේවකයන්ට ස්ථිර පත්වීම් ලබාදීම.</u>**

2026.04.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2026 අනුව ඒකාබද්ධ රියදුරු සේවයේ විධිමත් පත්වීමක් ලබාදීම සඳහා අවශ්‍ය ලේඛන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් ලේඛන ඇමුණුම අංක 04 හි සඳහන් අනුපිළිවෙලින් එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. පිටපත් ඉදිරිපත් කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ විධිමත් බලය පැවරූ නිලධාරියකු විසින් සත්‍ය හා නිවරදි බවට සහතික කර තිබිය යුතුය.

1. රෙජිස්ට්‍රාර් ජනරාල් / අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද උප්පැන්න සහතිකයේ දෙපසම සහතික කරන ලද පිටපත.
2. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත.
3. ඉදිරිපත් කරන සහතික වල නමෙහි වෙනසක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් (ඇමුණුම 07)
4. ශිෂ්‍ය කාර්ය දර්ශනයේ සහතික කරන ලද පිටපත.
5. රා.පරි.ච. 25/2014(I) අනුව අදාළ පුහුණු පාඨමාලාව සම්පූර්ණ කළ බවට නිකුත් කරනු ලබන සහතිකයේ සහතික කරන ලද පිටපත.
6. විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල ලේඛනයේ සහතික කරන ලද පිටපත (පෙනීසිට ඇත්නම් පමණක්).
7. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් (2019.09.01 දිනට පෙර) රියදුරු තනතුර අනුමත කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපත.
8. තාවකාලික/ අනියම් (දෛනික)/ ආදේශක/ කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගත් ලිපියේ සහතික කරන ලද පිටපත.
9. චර්යා සටහනේ (පොදු 226 ‘අ’) සහතික කරන ලද පිටපත (2019.09.01 දිනට වැඩ කරන දින 180 සම්පූර්ණ කර තිබිය යුතු ය)
10. තාවකාලික පත්වීම් ලිපියේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පිටපත. (ඇමුණුම 02 පරිදි)
11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය. (ඇමුණුම 04 ආකෘතිය)
12. කල් ඉකුත් නොවූ වලංගු රියදුරු බලපත්‍රයේ සහතික කරන ලද පිටපත (ඉලෙක්ට්‍රොනික රියදුරු බලපත්‍රය නොමැතිනම් ඒ වෙනුවට නිකුත් කරනු ලබන එක් එක් කාණ්ඩ කල් ඉකුත් වන දිනයන් පිළිබඳ විස්තර සහිත සහතිකය ඉදිරිපත් කළ යුතු ය)
13. සාමාන්‍ය පෙනීම, රාත්‍රී ඇස් පෙනීම සහ වර්ණ දෘෂ්ටිය පිළිබඳ රජයේ වෛද්‍ය නිලධාරියෙකුගේ නිර්දේශය (සෞඛ්‍ය 169 / සෞඛ්‍ය 307)
14. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඒකාබද්ධ සේවා අංශයෙහි ඉ-මානව සම්පත් ව්‍යාපෘතිය යටතේ දක්වා ඇති දත්ත පත්‍රිකාව බාගත කර සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

ඇමුණුම 07

## දිවුරුම/ප්‍රතිඥා ප්‍රකාශයයි

(ලිපිනය)........................................................යන ලිපිනයේ පදිංචි, (උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි වාසගම සහිත නම ) .................................................................................... .(ජා.හැ.අංක ..............................) වන මම (ආගම)........................ ආගමිකයෙකු ලෙස පහත සඳහන් පරිදි අවංක ලෙස දිවුරුම්/ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි.

01. ඉහත නම් සඳහන් ප්‍රතිඥා ප්‍රකාශිකාව/ප්‍රකාශකයා මම වෙමි.
02. මාගේ ........ අංක දරණ උප්පැන්න සහතිකයේ නම .................................................. ලෙස සඳහන්ව ඇත.
03. මාගේ .......... අංක දරණ ජාතික හැඳුනුම්පතෙහි නම .................................................. ලෙස සඳහන්ව ඇත.
04. මාගේ ශිෂ්‍ය කාර්ය දර්ශනයෙහි නම.................................................. ලෙස සඳහන්ව ඇත.
05. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/ පාසල (පාසලෙහි නම සඳහන් විය යුතුය) වෙතින් මා වෙත නිකුත් කර ඇති අ.පො.ස. (සා/පෙළ) ............. වර්ෂයේ .................. විභාග අංක දරණ ප්‍රතිඵල සටහනෙහි නම ............................................................. ලෙස සඳහන්ව ඇත.
06. තාවකාලික, අනියම්(දෛනික)/ආදේශක/කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගන්නා ලද ලිපියේ නම ........................................................................... ලෙස සඳහන් වේ.

(ඒ ඒ සහතික වල සඳහන් නම ඒ ආකාරයෙන්ම සඳහන් කරන්න)

ඒ අනුව මා විසින් ප්‍රකාශ කර සිටින්නේ ඉහත අංක 02 ,03, 04, 05, හා 06 යන නම් සියල්ලන්ගෙන්ම හඳුන්වනු ලබන්නේ ................................................ වන මා පමණක් බවයි.

රු.50

මුද්දරය

දිවුරුම්/ප්‍රතිඥා ප්‍රකාශකයා/ප්‍රකාශිකාව

ඉහත සඳහන් ප්‍රකාශය ප්‍රකාශිකාව/ප්‍රකාශකයා

විසින් කියවා බලා තේරුම් ගැනීමෙන් අනතුරුව

මා ඉදිරිපිටදී ................. දින ......................... දී

අත්සන් තබන ලදී.

අත්සන/නිල මුද්‍රාව